# ආසියා-ශාන්තිකර කලාපීය Ozone2Climate චිත්‍ර තරඟය නියමයන් සහ කොන්දේසි

# 1. අදහස්

1.1. වියනා සම්මුතිය හා කිගාලි සංශෝධනය ඇතුලත් මොන්ට්‍රියල් සම්මුතිය අදාල කරගත් ඕසෝන් වියන ආරක්ෂා කිරීම හා දේශගුණික විපර්යාස අවම කිරීමට අදාල ජයග්‍රහණ, ක්‍රියාමාර්ග සහ ප්‍රතිලාභ. නිර්මාණය මගින් පහත සඳහන් අදහස් පිළිබඳ, එහෙත් ඊට පමණක් සීමා නොවූ පණිවුඩ ලබා දිය හැකිය:

- කිගාලි සංශෝධනය ඇතුලු මොන්ට්‍රියල් සම්මුතිය ක්‍රියාත්මක කිරීම මගින් ඕසෝන් වියනට අත්වන ප්‍රතිලාභ සහ දේශගුණය ආරක්ෂා කිරීම. උදා: අලුත්වැඩියාකිරීමේ යහපත් පුරුදු, මොන්ට්‍රියල් සම්මුතිය යටතේ පාලිත ද්‍රව්‍යයන් ආදේශ කිරීම සඳහා ඕසෝන් හා දේශගුණ හිතකාමී විකල්ප යනාදිය අදාල කරගැනීම.
- කිගාලි සංශෝධනය ඇතුලු මොන්ට්‍රියල් සම්මුතිය ක්‍රියාත්මක කිරීමට ආධාර වීම සඳහා මහජනතාවට ගත හැකි ක්‍රියාමාර්ග/ප්‍රමුඛතාවන්
- මොන්ට්‍රියල් සම්මුතිය, සුවිශේෂිව දේශගුණික විපර්යාස සමඟ කිගාලි සංශෝධනය යටතේ ඕසෝන් වියන සහ දේශගුණය ආරක්ෂා කිරීමේ කටයුතු අතර සම්බන්ධතාව
- මොන්ට්‍රියල් සම්මුතිය ක්‍රියාත්මක කරනු ලබන පසුබිම තුළ ඕසෝන් වියන සහ දේශගුණය ආරක්ෂාකිරීම වෙනුවෙන් කාන්තාවන්ගේ භූමිකාව සහ දායකත්වය
- 2022 වර්ෂය තුළ ඕසෝන් වියන තුනී කරන ද්‍රව්‍යයන් පිළිබඳ මොන්ට්‍රියල් සම්මුතියේ 35වන සංවත්සරය
- ඕසෝන් වියන හා දේශගුණය ආරක්ෂා කරගැනීමේ මෙහෙයුම වෙනුවෙන් හොඳින්ම දායකත්වය ලබාදීම සඳහා ශීත කිරීමේ සහ වායුසමනය කිරීමේ උපකරණ සවිකිරීමේ, අලුත්වැඩියා කිරීමේ, නඩත්තු කිරීමේ සහ බැහැර කිරීමේ යහපත් පුරුදු
- මොන්ට්‍රියල් සම්මුතිය ක්‍රියාත්මක කිරීමට අදාල ජයග්‍රහණ
- තිරසර සංවර්ධන අරමුණුවලට දායක වන, මොන්ට්‍රියල් සම්මුතිය යටතේ ගෙන ඇති ක්‍රියාමාර්ගවල බලපෑම
- ඕසෝන් වියන තුනී වීමේ අහිතකර බලපෑම/ප්‍රතිඵල

1.2. **2021 ලෝක ඕසෝන් දිනයේ තේමාව**

***අපව, අපගේ ආහාර හා එන්නත් නිදහස් මට්ටමක තබනා මොන්ට්‍රියල් සම්මුතිය (Montreal Protocol - Keeping us, our food and vaccines cool)***

ඕසෝන් වියන ආරක්ෂා කිරීමේ අරමුණින් ගෝලීය ගිවිසුමක් ලෙස මොන්ට්‍රියල් සම්මුතිය ආරම්භ කරන ලද අතර, අද වන විටද ක්‍රියාත්මක අති සාර්ථකම පරිසර ගිවිසුම්වලින් එකක් බවට පත්වෙමින්, එහි කර්තව්‍යයන් ඉටු කර ඇත. ඕසෝන් ස්ථරය තුනී කරන ද්‍රව්‍ය අදියරගතව ඉවත් කිරීම සඳහා වන එක්සත් ගෝලීය ප්‍රයත්නය මගින් අද වන විට ඕසෝන් වියනේ ඇති සිදුරු යථා තත්ත්වයට පත්වෙමින් ඇති අතර, ඊට ප්‍රතිචාරී ලෙස මානව සෞඛ්‍යය, ආර්ථිකය සහ පරිසර පද්ධති ආරක්ෂා කරමින් ඇත. එහෙත්, මෙම වසරේ ලෝක ඕසෝන් දිනය මගින් අවධාරණය කිරීමට ප්‍රයත්න දරන පරිදි, මොන්ට්‍රියල් සම්මුතිය මගින් දේශගුණ විපර්යාස සිදු වීමේ ශීඝ්‍රතාව අඩු කිරීම හා ආහාර සුරක්ෂිතතාව සඳහා දායක වන

ශීතකාරක අංශයෙහි බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට උපකාරී වීම වැනි කාර්යයන් ඉටු කරනු ලබයි.

ඕසෝන් ස්ථරය තුනී කරනු ලබන බොහෝ ද්‍රව්‍ය මගින් දේශගුණය උණුසුම් කරන හෙයින්, මෙම ගිවිසුම මගින් දැනටමත් දේශගුණ විපර්යාස හටගැනීමේ ශීඝ්‍රතාව අඩු කර ඇත. මොන්ට්‍රියල් සම්මුතියට සිදු කර ඇති කිගාලි සංශෝධනය මගින් වඩාත් ශක්තිමත් දේශගුණික ප්‍රතිලාභ ලබා දීමට අපේක්ෂා කෙරේ.මෙම සංශෝධනය යටතේ, හයිඩ්‍රොෆ්ලුරෝකාබන් (HFCs) අදියරගතව අඩු කිරීමට ජාතීන් විසින් වගවී ඇත.හයිඩ්‍රොෆ්ලුරෝකාබන් මගින් ඕසෝන් ස්ථරයට හානි සිදු නොකළද, මෙම ශීතකාරක (coolants) ප්‍රබල හරිතාගාර වායු වේ. එකඟ වී ඇති පරිදි, මේවා භාවිතය අවම කිරීම මගින් ඕසෝන් ස්ථරය අඛණ්ඩව රැකගනිමින්, සියවස අවසන් වන විට ගෝලීය උෂ්ණත්වය සෙල්සියස් අංශක 0.4 දක්වාඅවම කරගැනීමට අපේක්ෂිතය.

කිගාලි සංශෝධනය මගින් ශීතකාරක අංශයේ වැඩිදියුණු කරන ලද බලශක්ති කාර්යක්ෂමතාව සඳහා ද අවස්ථාව සැලසේ. හයිඩ්‍රොෆ්ලුරෝකාබන්වලට ආදේශක ලෙස භාවිත කළ හැකි නව නිෂ්පාදිත මගින් අඩු බලයක් භාවිත කිරීම සඳහා වායු සමීකරණ හා අධිශීතකරණ පද්ධති නැවත සැලසුම් කිරීමට අවස්ථාව සලසා දෙන අතර, දේශගුණික බලපෑම් ඉහළයාමකින් තොරව, ශීත කිරීමේ සහ ශීත දාම කාර්යක්ෂමතාව පහසුවෙන් පුළුල් කිරීමට ඉන් ඉඩ සැලසේ. විශේෂයෙන් සංවර්ධනය වන ආර්ථිකයක් සහිත රටවල හයිඩ්‍රොෆ්ලුරෝකාබන් පරිභෝජනය හා වැඩිදියුණු වූ ශීත දාම කාර්යක්ෂමතාව අඩු කිරීමේ සංයුතිය ආහාර විනාශවී යාමට එරෙහිවද සටන් කරයි.

මානව පරිභෝජනය වෙනුවෙන් ගෝලීය වශයෙන් නිපදවනු ලබන සියලුම ආහාරවලින් තුනෙන් එකක පමණ කොටසක් සෑම වර්ෂයකම විනාශ වීම හෝ අපතේ යාම සිදු වන අතර, එසේ සිදු වීමට ශීත දාම ලබාගැනීමට ඇති අවස්ථා හිඟ වීම ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. ආහාර විනාශ වීම සහ අපතේ යාම වසරකට එක්සත් ජනපද ඩොලර් බිලියන ගණනක් අපතේ යාමක් වන අතර, භූමිය, ජලය හා බලශක්තිය වැනි අතිශයින් වටිනා සම්පත් අපතේ යාමක් පමණක් නොව, වර්ෂයකට ගෝලීය වශයෙන් 8%ක ඇස්තමේන්තුගත හරිතාගාර වායු ප්‍රමාණයක්ද එමගින් උත්පාදනය කෙරේ.

මිලදී ගෙන, ක්‍රියාත්මක කළ හැකි ආකාරයේ වඩාත් කාර්යක්ෂම, දේශගුණ හිතකාමී සහ ලාභදායී ශීතදාම විසඳුම් වැඩිදියුණු කිරීම මගින් එකී දාම වඩාත් ඵලදායී මෙන්ම වැඩි වශයෙන් ලබාගත හැකි වනු ඇත. මෙමගින් ගොවීන් සහ ඖෂධ සැපයුම්කරුවන් වැනි නිෂ්පාදිකයින්ට පූර්ව ශීතකිරීමේ, අධිශීතකරණ ගබඩා පහසුකම් මෙන්ම අධිශීතකරණ සහිත ප්‍රවාහන පහසුකම් ලබාගැනීමට නිෂ්පාදකයින්ට අවස්ථාව සැලසෙන අතර, එමගින් ආහාර සහ එන්නත් වැනි නිෂ්පාදිත ආරක්ෂිතව සහ මනා තත්ත්වයෙන් ජනතාව වෙත ළඟාවීම තහවුරු කෙරේ.

මෙම ලෝක ඕසෝන් දිනයේදී, අප, අපගේ ආහාර සහ එන්නත් නිදහස් මට්ටමක තබාගැනීමට මොන්ට්‍රියල් සම්මුතිය සහ එහි කිගාලි සංශෝධනය මගින් ගනු ලබන පුළුල් ප්‍රයත්නයන් සමරා, පිළිගනිමු!

# 2. සම්පත් :

https://www.ozone2climate.org/resources

# 3. සුදුසුකම්:

දකුණු ආසියාවේ, ගිණිකොණදිග ආසියාවේ සහ පැසිෆික් දූපත්වල පිහිටි රටවල ඕනෑම අයෙකුට මීට සහභාගිවීමට හැකිය. වයස අවුරුදු 15ට අඩු සහභාගිවන්නන් දෙමව්පියන්ගේ අවසරය ලබා ගත යුතුය.

3.1. **වයස් කාණ්ඩ**

- **තරුණ කාණ්ඩය:** 2021 සැප්තැම්බර් 16 දිනට වයස අවුරුදු 15ක් හෝ ඊට අඩු වයසක පසුවන යම් තනි අයදුම්කරුවෙකු හෝ යම් කණ්ඩායමක් සඳහා (ලෝක ඕසෝන් දිනය). අයදුම්පත්‍රය සහ කලා නිර්මාණය ඉදිරිපත් කිරීමේදී මෙම කාණ්ඩයෙන් සහභාගිවන අයදුම්කරුවෙකු දෙමව්පියන්ගේ කැමැත්ත ලබාගත යුතුය.
- **සාමාන්‍ය කාණ්ඩය:** 2021 සැප්තැම්බර් 16 දිනට වයස අවුරුදු 15ට වැඩි යම් තනි අයදුම්කරුවෙකු හෝ යම් කණ්ඩායමක් සඳහා (ලෝක ඕසෝන් දිනය).

මෙම තරඟ, දකුණු ආසියාවේ, ගිණිකොණදිග ආසියාවේ සහ Compliance Assistance Programme ජාලයේ පැසිෆික් දූපත්හි පිහිටි රටවල ජාතිකත්වය හිමි හෝ එකී කලාපවල ජීවත්වන අයදුම්කරුවන්ට හෝ කණ්ඩායම්වලට විවෘතය.

- ප්‍රවේශ වීම සඳහා ජාතික මට්ටමින් කලාපීය මට්ටමේ තරඟයට ඇතුලුවීම සඳහා ජයග්‍රාහකයින් ලෙස තෝරාගත් විට, අයදුම්කරුවන්ගේ හා තරුණ කාණ්ඩයට සුදුසුකම් සහිතද යන්න ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍රය මගින් සනාථ කෙරේ.
- සංවිධායක කමිටුවට, විනිශ්චයකාරවරුන්ට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට සහභාගිවීමට සුදුසුකම් හිමි නොවේ.
- මෙම තරඟයට සහභාගිවීම සඳහා විශේෂයෙන් කාන්තා අයදුම්කරුවන් දිරිමත් කෙරේ.

(1) සහභාගිවන කණ්ඩායමක් සම්බන්ධයෙන්, එම කණ්ඩායමේ සාමාජිකයින්ගේ වැඩිම වයස මත කාණ්ඩය (තරුණ හෝ සාමාන්‍ය යන වග) තීරණය කරනු ලබයි. කලාපීය තරඟයකදී ජයග්‍රාහකයෙකු/දෙවන ස්ථානලාභියා බවට පත්වුවහොත්, එම කණ්ඩායමේ එක් එක් සාමාජිකයා වෙත සහතිකයක් සහ සමරු ඵලකයක්/කුසලානයක් පිරිනමනු ඇත.

(2) *ඇෆ්ගනිස්ථානය, බංග්ලාදේශය, භූතානය, බෲනෙයි දරුස්සලාම්, කාම්බෝජය, චීනය, කුක් දූපත්, ෆීජී, ඉන්දියාව, ඉන්දුනීසියාව, ඉරානය, කිරිබතී දූපත්, උතුරු කොරියාව, කොරියානු ජනරජය (දකුණු කොරියාව), ලාඕසය, මැලේසියාව, මාලදිවයින, මාෂල් දූපත්, මයික්‍රොනීසියාව, මොංගෝලියාව, මියන්මාරය, නවුරු දූපත්, නේපාලය, නියූ (Niue) දූපත, පාකිස්ථානය, පලාවු, පැපුවා නිව් ගිනියාව, පිලිපීනය, සැමෝවා, සිංගප්පූරුව, සොලමන් දූපත්, ශ්‍රී ලංකාව, තායිලන්තය, නැගෙනහිර ටිමෝරය, ටොන්ගා, තුවාලු, වනුවාතු සහ වියට්නාමය.*

# 4. කලා නිර්මාණ කාණ්ඩ

**ඡායාරූපකරණය**: දැඩි ලෙස සංස්කරණය කිරීමෙන් (අතිරේක ද්‍රව්‍ය එක්කිරීම හෝ මුල් ඡායාරූපයෙන් යම් ද්‍රව්‍යයක් ඉවත් කිරීම වැනි) තොරව, කැමරාවකින් ලබාගත් මුල් ඡායාරූප ඇතුලත්ය. ආලෝකය, දීප්තිය, වර්ණ වෙනස් කිරීම වැනි සුළු ඡායාරූප ගැලපුම් භාවිත කළ හැකිය.

**සිතුවම්කරණය :** සාම්ප්‍රදායික හස්ත සිතුවම්/චිත්‍ර හෝ අතින් නිර්මාණය කරන ලද තල දෙකේ (two-dimensional) වෙනත් කලා හෝ ඩිජිටල් නිර්මාණ ඇතුලත්ය.


**ග්‍රැෆික් නිර්මාණ:** පරිගණක භාවිත කරමින් සිදු කරන ලද නිර්මාණ සහ පරිගණක හෝ ජංගම දුරකථන යෙදවුම් මගින් නිර්මාණය කරන ලද ග්‍රැෆික් වැඩසටහන්/යෙදවුම් ඇතුලත්ය.

# 5. නිදර්ශක

ග්‍රැෆික් නිර්මාණ




Credit: Shutterstock



Credit: Andreas Barry,
National Ozone Unit, Indonesia

**සිතුවම්කරණය**



Credit: Mariam Aliza Anwaar, aged 12, Pakistan, 'The Effect of Ozone Depletion on the Earth'
in UNEP's 1998 Children's Painting Competition



Credit: Laila Nuri, aged 8, Indonesia in UNEP's 1998 Children's Painting Competition

**ඡායාරූපකරණය**



Credit: Shutterstock



Credit: Shutterstock

# 6. කලා නිර්මාණ ඉදිරිපත් කිරීම

- කලා නිර්මාණ උඩුගත කිරීම සඳහා වන මාර්ගගත තරඟ අවකාශය ([https://www.ozone2climate.org/artworksubmission](https://www.ozone2climate.org/artworksubmission)) 2022 මාර්තු 31 දින ශ්‍රී ලංකාවේ වේලාවෙන් ප.ව.10.30 දක්වා විවෘතය.
- මෙම අවකාශය මඟින් සියලුම අයදුම්කරුවන්ට සහ මහජනතාවට පහත සඳහන් තොරතුරු/සේවාවන් ද ලබා දෙනු ඇත: මොන්ට්‍රියල් සම්මුතිය පිළිබඳ පසුබිම් තොරතුරු, තරඟය පිළිබඳ විස්තර සහ ඇගයීමේ පටිපාටිය ඇතුලු එහි රීති; NOU විසින් එවන ලද නම් කිරීම් අතුරින් කලා නිර්මාණ සඳහා මහජනතාවට ඡන්දය පල කිරීමට ඇති අවකාශය; සහාය ලබාදෙන අංශය හෝ අවශ්‍ය වෙනත් යම් වගකීම්වලින් බැහැරවීම්.
- කලාපීය මට්ටමේදී එක් තරඟකරුවෙකුට හිමිවන්නේ එක් සම්මානයක් පමණක් වන නමුත්, එක් එක් තරඟකරුවාට කලා නිර්මාණ එකකට වැඩි සංඛ්‍යාවක් (කලා කාණ්ඩය නොසලකමින් නිර්මාණ 6කට නොවැඩි) උඩුගත කිරීමට අවසර ලැබේ.
- ඩිජිටල් ඡායාරූපය සහිත ගොනුවේ ප්‍රමාණය අවම වශයෙන් පික්සල් 2,000ක් විය යුතු අතර, එකී ගොනුව මෙගාබයිට් 1කට වැඩි විය නොහැකිය. ඔබේ ඉදිරිපත් කිරීම අවසන් වටයට හෝ ජයග්‍රාහී ලෙස තෝරාගතහොත්, මුද්‍රණය කිරීමට සහ ප්‍රදර්ශනය කිරීමට හෝ අයදුම්කරුවන්ගෙන් ඉහළ විභේදනයක් (high-resolution) සහිත ඡායාරූප ඉල්ලා සිටිනු ඇත.
- කලා නිර්මාණ පහත සඳහන් ගොනු ආකෘති මඟින් ඩිජිටල් ඡායාරූප ගොනු ලෙස ඉදිරිපත් කළ යුතුය: JPEG/GIF/PNG
- **සිතුවම්කරණය සඳහා A3 (297×420 mm) ප්‍රමාණයේ කොළ වඩාත් යෝග්‍ය වේ.**
- **ඕනෑම මාධ්‍යයක පාට භාවිතා කළ හැක.**
- සෑම කලා නිර්මාණයක්ම පහත සඳහන් තොරතුරු සමඟ ඉදිරිපත් කළ යුතුය:
    * මාතෘකාව
    * නිර්මාණය කරන ලද දිනය
    * කලා නිර්මාණය විස්තර කෙරෙන කොටස (ඉංග්‍රීසි භාෂාවෙන් හෝ ජාතික භාෂාවෙන් උපරිම වචන 100)
- වාණිජමය වෙළඳ සලකුණු සහ/හෝ සමාගම් නාම යනාදියේ රූප සහිත යම් කලා නිර්මාණයක් තරඟයෙන් ඉවත් කරනු ඇත.

# 7. ඇගයීම්

7.1. සාමාන්‍ය - ඡායාරූපකරණ කාණ්ඩය
7.2. සාමාන්‍ය - සිතුවම්කරණ කාණ්ඩය
7.3. සාමාන්‍ය - ග්‍රැෆික් නිර්මාණ කාණ්ඩය
7.4. තරුණ - ඡායාරූපකරණ කාණ්ඩය
7.5. තරුණ - සිතුවම්කරණ කාණ්ඩය
7.6. තරුණ - ග්‍රැෆික් නිර්මාණ කාණ්ඩය

**තෝරාගැනීමේ පටිපාටිය**

අ. තේමාවට/මාතෘකාවට ඇති අදාලත්වය
ආ. නිර්මාණාත්මක, නව්‍ය හා දිරිගන්වනසුළු
ඇ. කලා නිර්මාණයේ ගුණාත්මකබව
ඈ. සමස්ත වශයෙන් දනවන හැඟීම

**ජාතික (ශ්‍රී ලාංකික) මට්ටමේ තරඟය**

NOU (අවශ්‍ය පරිදි, UNEP හා සහාය ලබා දෙන පාර්ශ්වකරුගෙන් ලැබෙන සහාය ද සහිතව) විසින් පහත සඳහන් කාණ්ඩවලට අනුව ඉදිරිපත් කරන සියලුම නිර්මාණ ඇගයීමක් සිදු කරනු ඇත. එක් එක් කාණ්ඩය යටතේ, එකී කාණ්ඩය තුළ ජාතික මට්ටමේ ප්‍රථම ස්ථානය දිනාගන්නා ජයග්‍රාහකයාට පමණක් කලාපීය තරඟය සඳහා පිවිසීමට ඉඩ ලබා දෙනු ඇත.

NOU සහ UNEP එක්ව, මෙම තරඟයට සහභාගිවීම වෙනුවෙන් එක් එක් තරඟකරුවා වෙත **මුද්‍රණය කරන ලද සහතික පත්‍රයක්** පිරිනමනු ඇත. මාර්ගගත ක්‍රමය ඔස්සේ ප්‍රවේශ විය නොහැකි අයදුම්කරුවන් nouwod.lk@gmail.com හරහා NOU Sri Lanka හෝ 0112 034 221 ඔස්සේ එම්.සරදාන්ජලී මෙය අමතන්න.

එම අයදුම්කරුවන්ට සිය කලා නිර්මාණ ඉදිරිපත් කිරීම සඳහා පහසු ක්‍රමවේදයක් සලසා දෙනු ඇත.

**කලාපීය මට්ටමේ තරඟය**

ජාතික තරඟයේ එක් එක් කාණ්ඩය යටතේ ජයග්‍රහණය කරන ලද තරඟකරුවන්ගේ කලා නිර්මාණ මාර්ගගතව මහජනතාවගේ ඡන්ද ලබාගැනීම පිණිස ඩිජිටල් මාර්ගයක් වෙත උඩුගත කරනු ඇත. සම්මානය වෙනුවෙන් අවසන් ඇගයීම පහත සඳහන් සාධක මත පදනම් වනු ඇත:

* මහජනතාවගේ ඡන්දයෙන් 30%
* කලාපයේ ජාතික ඕසෝන් ඒකකයෙන් (NOU) 35%
* UNEP, UNESCO සහ විශේෂඥයින්ගෙන් සමන්විත විනිශ්චයකාරවරුන්ගේ කමිටුවෙන් 35%

# 8. සම්මාන

### 8.1 ජාතික මට්ටම

ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේදී වටිනා ජයග්‍රාහී ත්‍යාග තුනක් (ජයග්‍රාහකයා, දෙවන හා තෙවන ස්ථාන) සහ සැනසිලි ත්‍යාග දෙකක් පිරිනමනු ඇත. ජාතික මට්ටමේ ත්‍යාගයන්හි විස්තර පහත සඳහන් පරිදි වේ:

* ජයග්‍රාහකයා : රු.20,000.00
* දෙවන ස්ථානය : රු.15,000.00
* තෙවන ස්ථානය : රු.10,000.00
* සැනසිලි ත්‍යාගය : රු.5,000.00

### 8.1 කලාපීය මට්ටම

එක් එක් කාණ්ඩයේ ජයග්‍රාහකයෙකුට සහ ඉන්පසු ස්ථාන හිමිකරගත් පස්දෙනෙකුට UNEP වෙතින් සහතිකයක් සහ සමරු ඵලකයක්/කුසලානයක් ප්‍රදානය කරනු ඇත. කලාපීය ජයග්‍රාහකයින් ලෙස තෝරානොගත් එක් එක් රටේ ජාතික මට්ටමේ අවසන් තරඟකරුවන් ඇතුළත් කෙරෙන "ගෞරවනීය සඳහන් කිරීම් (honorable mention)" සම්මාන ප්‍රදාන කොටසක් ද එහි වනු ඇත.

අවසන් තරඟකරුවන්ගේ සහ ගෞරවනීය සඳහන් කිරීම් මගින් ගෞරවයට පාත්‍ර වූ තරඟකරුවන්ගේ කලා නිර්මාණ ප්‍රමුඛ වශයෙන් UNEP සහ පාර්ශ්වකරුවන්ගේ වෙබ් අඩවිවල, ප්‍රකාශනවල, සමාජ මාධ්‍යයන්හි සහ වෙනත් මාධ්‍යයන්හි ප්‍රදර්ශනය කෙරෙනු ඇත. 2022 වර්ෂයේ ලෝක ඕසෝන් දිනයේදී ඔබේ රටේ ජයග්‍රාහකයා ප්‍රවර්ධනය කරන ලෙස රටවල් දිරිගැන්වේ.

# 9. ප්‍රකාශන අයිතිය සහ නීතිමය කරුණු

තරඟයට ඉදිරිපත්වන්නන් තමා ඉදිරිපත් කරන කලා නිර්මාණවල පරම කර්තෘ විය යුතු අතර, එකී නිර්මාණවල සියලුම බුද්ධිමය දේපල අයිතීන් දැරිය යුතුය. මෙම කලා නිර්මාණ මුල් නිර්මාණ විය යුතු අතර, ජීවත්වන රට නොසලකමින්, යම් තෙවන පාර්ශ්වයක බුද්ධිමය දේපල හෝ වෙනත් අයිතීන් උල්ලංඝනය නොකළ යුතු සේම, පෙර තරඟවලදී ජයග්‍රහණය නොකර ඇති සේම, වෙනත් යම් මාධ්‍යයක (මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍යයක) ප්‍රකාශයට පත් කර නොමැති සහ මෙම තරඟය අතරවාරයේදී වෙනත් යම් තරඟයකට නිර්මාණයක් ලෙස ඉදිරිපත් කර නොතිබිය යුතුය. මොනයම් අවස්ථාවකදී හෝ අන් අයගේ නිර්මාණ තමාගේ සේ ඉදිරිපත් කිරීමට අවසර නොලැබේ. ඉදිරිපත් කිරීමට පෙර ප්‍රකාශන අයිතියේ සියලුම පැතිකඩ නිරාකරණය කිරීම තරඟයට ඉදිරිපත්වන්නාගේ වගකීම වේ. තෙවන පාර්ශ්වයකගේ ප්‍රකාශන හෝ වෙනත් යම් බුද්ධිමය දේපල අයිතියක් උල්ලංඝනය කෙරෙන යම් නිර්මාණ ඉදිරිපත් කිරීමක් තරඟයෙන් ඉවත් කිරීමට UNEPට අයිතිය ඇති අතර, යම් ප්‍රකාශන අයිතියක් උල්ලංඝනය කිරීමක් හෝ බලය නොලත් නිර්මාණ ඉදිරිපත් කිරීමක් සඳහා වග නොකියන්නා සේම, ඊට කවරාකාරයෙන් හෝ වග නොවේ.

තරඟයට සහභාගිවන්නන්, සකස් කර, ඉදිරිපත් කරන ලද කලා නිර්මාණයේ ප්‍රකාශන අයිතියක්, ආශ්‍රිත අයිතියක් හෝ නෛතික වශයෙන් හටගෙන ඇති හෝ ඇති විය හැකි වෙනත් බුද්ධිමය දේපල අයිතීන් කිසිදු පිරිවැයකින්/වගකීමකින්/සීමාකිරීමකින් තොරව භාවිත කිරීම සඳහා අනන්‍ය නොවූ, අවලංගු කළ නොහැකි, මාරු කළ හැකි, ස්ථිර හා ලෝකයටම වලංගු වන ආකාරයේ බලපත්‍රයක් NOU Sri Lanka, UNEP සහ UNEP මගින් බලය ලබා දී ඇති වෙනත් පුද්ගලයින් හෝ ආයතනය වෙත ප්‍රදානය කරයි. අනෙක් අතට, එකී කලා නිර්මාණ UNEP මගින් භාවිත කිරීමේදී, එම නිර්මාණවල කර්තෘ/නිර්මාණකරු සඳහන් කර, නිසි ලෙස ඔහුට/ඇයට ලබා දිය යුතු ගරුත්වය ලබාදීමට UNEP බැඳී සිටියි. තරඟය අතරතුරදී සහ අවසන් වීමෙන් පසුව,

සමස්තයක් ලෙස හෝ අර්ධ වශයෙන්, මුල් නිර්මාණවල සංස්කරණය කරන ලද පිටපත් ද ඇතුලුව සියලුම නිර්මාණ UNEP වෙබ් අඩවියේ/ප්‍රකාශනයේ හෝ වෙනත් අදාල වෙබ් අඩවිවල/ප්‍රකාශනවල ප්‍රචාරණය කිරීමට UNEP හට අයිතිය ඇත.

නිදසුනක් ලෙස යම් පුද්ගලයෙකුගේ ඡායාරූපයක් වැනි මානවයින්ට අදාල කලා නිර්මාණ සම්බන්ධයෙන්, තරඟයට ඉදිරිපත් කරන කලා නිර්මාණවල අන්තර්ගත පුද්ගලයින්ගේ අවසරය සහ එකඟතාව ලබාගෙන තිබිය යුතු අතර, UNEP විසින් එම කලා නිර්මාණ භාවිත කිරීම හෝ ප්‍රචාරණය කිරීම සිදු කළ හැකිය. කෲර, නෛතික නොවන, විශේෂ කොට සලකන, ලිංගික අන්තර්ගතයන් ඇතුලත් හෝ අපහාසාත්මක කරුණු හෝ එම කලා නිර්මාණය සිදු කර, සංස්කරණය කරන ලද රටට අදාල යම් නීතියක් උල්ලංඝනය කරන කරුණක් මෙම කලා නිර්මාණවල අන්තර්ගත නොවිය යුතු අතර, එසේ නොමැති නම්, පිළිගැනීමට ලක් කළ නොහැකි වේ. මෙම නිර්මාණ තුළ යම් තෙවන පාර්ශ්වයකගේ වෙළඳ ප්‍රචාරණයක්, සටන් පාඨයක්, සලකුණක් හෝ වෙළඳ නාමයක් හෝ අන්තර්ගත නොවිය යුතු අතර, වෙනත් ආකාරයකින් යම් තෙවන පාර්ශ්වයකගේ හෝ වාණිජමය ආයතනයක අනුග්‍රාහකත්වය හෝ නිර්දේශ කිරීමක් සඳහන් නොකළ යුතුය.

තරඟයේ පැතිකඩවල් හෝ තරඟයම වෙනස් කළහොත් හෝ අවලංගුකළහොත් හෝ UNEP ඊට වග කියනු නොලැබේ. තරඟයට සහභාගිවන තරඟකරුවෙකු හට යම් ත්‍යාගයක් පිළිගැනීමේ හෝ පිළිනොගැනීමේ හේතුවෙන් සිදු වන හානියක්, පාඩුවක්, අන්ර්ථයක් හෝ කළකිරීමක් සම්බන්ධයෙන් UNEP කිසිදු වගකීමක් දරනු නොලැබේ.

UNEP හි පූර්ව ලිඛිත අවසරයකින් තොරව කිසිදු කාර්යයක් වෙනුවෙන් UNEPහි නම සහ/හෝ සලකුණ/ලාංඡනය භාවිත කිරීමට හෝ තෙවන පාර්ශ්වයකට භාවිත කිරීමට ඉඩ ලබාදීමට තරඟයට සහභාගිවන කිසිදු තරඟකරුවෙකු හට බලය ලබා නොදේ.

තාක්ෂණික බාධාවක් හෝ වරදක්, ජාලවල තදබදය හෝ වෙනත් යම් කරුණක් හේතුවෙන් ප්‍රමාද වන, සාවද්‍ය හෝ හඳුනාගත නොහැකි යම් පිළිතුරක්, ප්‍රවේශයක් හෝ ඉදිරිපත් කිරීමක් සඳහා සංවිධායකයා වග නොකියනු ලැබේ. යම් පිළිතුරක්, ප්‍රවේශයක් හෝ ඉදිරිපත් කිරීමක් පිළිබඳ ආරාවුලකදී, සංවිධායකයාගේ තීරණය අවසානාත්මක වේ.

මෙම සම්මානය හුවමාරු කළ නොහැකි, ආපසු අයකරගත නොහැකි, පවරා දිය නොහැකි මෙන්ම මුදල් හෝ මුදල් හා සමාන ද්‍රව්‍යයකට හෝ එවැනි ආකාරයේ වෙනත් යම් ප්‍රතිලාභයක් සඳහා හුවමාරු කළ නොහැකිය.